සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# විද්‍යාව

**6 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
| --- |

**I කොටස**

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. සෑම පිළිතුරකටම ලකුණු 2 බැගින් හිමිවේ.
- 1- 10 දක්වා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සියලු ජීවීන්ට පොදු ලක්ෂණයක් වන්නේ,

(1) සංචරණයයි. (2) ප්‍රජනනයයි.

(3) ප්‍රභාසංලේෂණයයි. (4) ශ්වසන චලන දැක්වීමයි.

02. අඳුර වැටෙන විට හැකිලෙන පත්‍ර <u>පමණක්</u> ඇති ශාක දැක්වෙන පිළිතුර වන්නේ,


(1) කතුරුමුරුංගා, කොහොඹ, සියඹලා. (2) කතුරුමුරුංගා, මාර, සියඹලා.

(3) කතුරුමුරුංගා, ඇහැල, සියඹලා. (4) කතුරුමුරුංගා, පේර, සියඹලා.

03. ජීවීන්ගේ අඛණ්ඩ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාවලිය වන්නේ,

(1) ශ්වසනය (2) පෝෂණය (3) ප්‍රජනනය (4) ප්‍රභාසංශ්ලේෂණය.

04. පහත රූපයෙන් දැක්වෙන්නේ ශාක පත්‍ර කිහිපයකි. A, B, C පිළිවෙළින් නම් කර ඇත්තේ,



A B C

(1) සරල පත්‍ර, සංයුක්ත පත්‍ර, සංයුක්ත පත්‍ර (2) සංයුක්ත පත්‍ර, සංයුක්ත පත්‍ර, සරල පත්‍ර

(3) සරල පත්‍ර, සරල පත්‍ර, සංයුක්ත පත්‍ර (4) සංයුක්ත පත්‍ර, සංයුක්ත පත්‍ර, සංයුක්ත පත්‍ර

05. පහත දැක්වෙන ඒවායින් පදාර්ථයක් වන්නේ,

(1) සූර්යතාපය (2) වාතය (3) විදුලිය (4) ශබ්දය

06. අජීවීන් සඳහා උදාහරණයකි.

(1) මුහුදු මල (2) කොරල් බුහුබාවා (3) පොල්ගස (4) පාෂාණ

07. භංගුර ද්‍රව්‍ය <u>පමණක්</u> ඇතුළත් පිළිතුර වන්නේ,

(1) යකඩ, අඟුරු, වීදුරු (2) අඟුරු, වීදුරු, රටහුණු

(3) ප්ලාස්ටික්, අඟුරු, රටහුණු (4) යකඩ, ප්ලාස්ටික්, අඟුරු



LIVEWORKSHEETS

08. වාතය සතු ලක්ෂණයක් වන්නේ,

(1) නිශ්චිත පරිමාවක් තිබීම. (2) නිශ්චිත හැඩයක් තිබීම.

(3) නිශ්චිත ස්කන්ධයක් තිබීම. (4) පැතිර නොයාම.

09. ප්‍රත්‍යාස්ථ ද්‍රව්‍යයක් වන්නේ,

(1) යකඩ (2) අඟුරු (3) රබර් (4) ප්ලාස්ටික්

10. ශාක වල ආහාර නිපදවීම සඳහා පරිසරයෙන් ලබා ගන්නා සංඝටකයක් වන්නේ,

(1) ජලය (2) ඔක්සිජන් (3) ඛනිජ ලවණ (4) නයිට්‍රජන්

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට වරහන තුළ ඇති ගැලපෙන වචන භාවිතා කර හිස්තැන් පුරවන්න.**

(ඔක්සිජන් වායුව, කාබන්ඩයොක්සයිඩ් වායුව, මුහුදු මල, සූර්යකාන්ත පුෂ්පය,

ස්වයංපෝෂීන්, විෂමපෝෂීන්)

11. ........................................................ චලන දක්වන නමුත් සංචරණය කළ නොහැකි සත්ත්වයෙකි.

12. ශාක තුළ ආහාර නිපදවීමේදී ........................................................ උපයෝගී කර ගනියි.

13. සතුන්, සෘජුව හෝ වක්‍රව ශාක නිපදවන ආහාර මත යැපෙන නිසා ඔවුන් ........................................................ ලෙස හඳුන්වයි.

14. ජීවීන් ස්වසනයේදී ........................................................ ලබා ගනියි.

15. සූර්යයා දෙසට හැරීම ........................................................ දක්වන චලනයකි.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල දී ඇති පැහැදිලි කිරීමට යෙදිය හැකි තනි පදය ලියන්න.**

16. පියවි ඇසට නොපෙනෙන ජීවීන් ........................................................

17. ජීවීන් වයසත් සමඟ ශරීර ප්‍රමාණයෙන් විශාල වීම ........................................................

18. සතුන් තැනින් තැනට ගමන් කිරීම ........................................................

19. ශාක ආහාර නිපදවාගැනීමේ ක්‍රියාවලිය ........................................................

20. ද්‍රව්‍යයක් ස්පර්ශ කිරීමේදී අතට දැනෙන සිනිඳු හෝ රළු බව ........................................................



LIVEWORKSHEETS